# බ්ලූබෙරී



ඔවිනි සේනාශ්‍රී රාජපක්ෂ

# බ්ලූබෙරි

## ඔවිනි සේනාශ්‍රී රාජපක්ෂ

ISBN 978-624-208-670-5

පළමු මුද්‍රණය

2025.02.08

කතෘ

ඔවිනි සේනාශ්‍රී රාජපක්ෂ

පිටු චිත්‍ර නිර්මාණය

ඔවිනි සේනාශ්‍රී රාජපක්ෂ

ප්‍රකාශකයෝ

ආර්.පි.ජයතිස්ස

76/5,නුවර පාර,කෙන්ගල්ල

කතෘගේ වෙනත් කෘති -

දිනූ හිරුකි

හරි අපූරු විස්සයි විස්ස

පුංචි මගෙ කවි එකතුව

කලබලේ

# පිදුම

පුංචි මට අයනු,ආයනු කියා දී
ලොව දිනන්නට සවිය දෙන
ආදරබර අම්මාට , අප්පච්චිට...
හිත පුරා සෙනෙහසින් ශිල්ප සාදා දෙන
මගේ ගුරු මව් ,පියවරුන්ට...
මල් වගේ ලස්සන, පිවිතුරු
පුංචි දරුවන්ගේ
පාට, තාල, අකුරු ,නිර්මාණ
හදවතින්ම අගය කරන
ආදරණීය මාමලා,නැන්දලා සැමට...
කතන්දර කියවා රස පිරි කලා ලොවට
එබී බලන්නට කැමති ඔබ සැමට
හරිම ආදරයෙන් පුදමි
මගේ පුංචි අකුරු ගැළපුම!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිද්ධිවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කෙරනි. හෙරණගත්කරණි ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# බ්ලූබෙරි

බ්ලූබෙරි පලතුර කොතරම් රසද........ "ඒක ගොඩාක් රස පලතුරක්." මම හිතන විදිහට හැමෝගෙම උත්තරය මේක වෙන්න ඇති. බ්ලූබෙරි අයිස්ක්‍රීම් එකක් කිව්වොත් නොදන්න කෙනෙක් නැහැ.කාපු නැති කෙනෙක් නැති තරම්.




ඉතින් මේ හැමෝම දන්නා අයිස්ක්‍රීම් එක "බ්ලූබෙරි" අයිස්ක්‍රීම් නමින් නිෂ්පාදනය කරලා එක්තරා පුද්ගලයෙක් ලොවම ප්‍රසිද්ධ අයිස්ක්‍රීම් සමාගමක  හිමිකරුවා  බවට පත් උනා.

මේ ලොවම දන්න හඳුනන ලොව ප්‍රසිද්ධ අයිස්ක්‍රීම් සමාගමේ දියුණුවට, අයිතිකරු බොහෝ මහන්සි වී ,කැපවෙලා වැඩ කරලා තියනවා.



දවසක් මේ සමාගමේ හිමිකරුට නගරයේ ප්‍රසිද්ධ පාසලක උත්සවයක ආරාධිත අමුත්තා වශයෙන් පැමිණෙන ලෙස ඇරයුම් කර තිබෙනවා. මෙතුමා මේ උත්සවයට සහභාගී වෙන්නේ හරිම ආඩම්බරයෙන්.මොහුගේ ප්‍රසිද්ධිය ,දියුණුව නිසා වෙන්න ඇති එහෙම උනේ.

ඔහු පාසල පුරාම විදුහල්පති සමඟ කතාබහ කරමින් ඇවිද්දා.නිරීක්ෂණය කළා. පාසල වටා ඇවිදිමින් ද කතා කරේ තම දියුණුවේ රහස ගැනයි.



“මම මගේ අයිස්ක්‍රීම් සමාගමේ දියුණුව ගැන බොහොම සැළකිලිමත් වෙනවා. හැමදෙනාම අප  සමාගම පිළිබඳව දැඩි විශ්වාසයක් තබා ගෙන සිටිනවා. ඒකට හේතුව තමයි අපි අයිස්ක්‍රීම් නිපදවන්න ගන්න පලතුරුවල ගුණාත්මක භාවය සහ නැවුම් බව අනිවාර්යෙන්ම  තහවුරු කර ගන්නවා.” නිෂ්පාදකවරයා දිගින් දිගටම කියන්නට වුණා.



කතාකරමින් ම විදුහල්පතිතුමාත් , බ්ලූබෙරි සමාගමේ හිමිකරුත් පාසලේ උත්සව පරිශ්‍රයේ අසුන් ගන්නට උනා.විදුහල්පතිතුමාගේ පිළිගැනීමේ කතාවෙන් අනතුරුව නර්තනයක මිහිරියාව වින්දා.මීළඟට යෙදී තිබුනේ

ප්‍රධාන ආරාධිත අමුත්තාගේ කතාවාරයයි....

දැන් අවස්ථාව ඔහුටයි.




ඔහුගේ සමාගමේ දියුණුව,රහස,කැපවීම ගැන දිගින් දිගටම කතා කළා .අනතුරුව පාසලේ දරුවන් වෙනුවෙනුත් යමක් කතා කළ යුතුයි පැවසුවා.

ඔහු මුලින්ම පාසලේ සුන්දරත්වය, පාසලේ මිහිරියාව ගැන තරමක් විස්තර කළා. ඊට පස්සේ ඔහු කතා කළේ  පාසලේ ළමයින් ගැන. "මේ පාසල කොතරම් සුන්දර  වුනත් පොඩිම පොඩි ගැටලුවක් තියනවා. ඒ තමයි මේ ළමයින්ගේ කතා කරන භාෂාව, හැසිරීම් ටිකක් හරිම අමුතුයි."

මෙහෙම කියද්දී ගුරුවරු සියල්ල මූණට මූණ බලා ගත්තා.



ආරාධිත අමුත්තා දිගින් දිගටම කතාව කරගෙන ගිහින් අවසානයේ දී ඔහු මෙහෙම කිව්වා. “ මං අහන්න කැමතියි , මගෙන් තව අහන්න ප්‍රශ්න මොනවත් තියනවාද?” කියලා. එක් ගුරුවරියක් සිය අසුනෙන් නැගිට මෙහෙම අහනවා .



"නිෂ්පාදකතුමනි, මදක් හිතන්න ඔබේ
ආයතනය, අයිස්ක්‍රීම් නිපදවන්න ගන්නා
පලතුරු සඳහා ඔබට බ්ලූබෙරි ඇනවුම්
කරන්න සිදුවෙනවා කියලා . එහෙම ගෙන එන
ලද බ්ලූබෙරි කන්ටේනර් එකෙන් බාගෙට
බාගයක්ම බ්ලූබෙරි ගෙඩි තැලී,පොඩිවී , නරක්
වී තිබුනොත් ඔබ ඒ ඇනවුමට මොකක්ද
කරන්නේ ?"





එවිට එතුමාගේ පිළිතුර වූයේ " මම එය භාරගන්නේ නැහැ. කන්ටෛනරයම ආපහු හරවලා යවනවා. මගේ මේ ප්‍රසිද්ධිය ,එහෙම නැත්තම්  දියුණුවට හේතුවත් එයම යි. මම අයිස්ක්‍රීම් නිෂ්පාදනය කරන්න භාවිතා කරන්නේ සියයට සියයක්ම නැවුම් පලතුරු."
ඔහු ගත් කටටම කියා ගෙන ගියා..



"හැබැයි නිෂ්පාදකතුමනි, ඔබ බ්ලූබෙරි නරක්වී,පොඩිවී තිබෙන නිසා ප්‍රතික්ෂේප කළාට, ගුරුවරුන්වන අපට ළමයින්ව එහෙම ප්‍රතික්ෂේප කරන්න බැහැ. ගුරුවරුන් පාසලට එන ඕනෑම තරාතිරමකම ඉන්න ළමයින් සමඟම කටයුතු කරන්න වෙනවා. ගුරුවරුන්ට හොඳ ළමයි, නරක ළමයි භේදයක් නැහැ. පාසලට එන හැම ළමයෙක්ම යහගුණ දම් වලින් පෝෂණය කරන්න ගුරුවරුන්ට සිදු වෙනවා. ඔබතුමාලා නරක් වෙච්ච, තැලිච්ච බ්ලූබෙරි කන්ටේනර් එක ආපහු හරවලා යැව්වට, අපට බෑ පාසලට එන ළමයින්ව උගත්කම මදියි, ගුණ දම් අඩුයි, ඉගෙනගන්න අපහසුයි කියල හිතලා හරවලා යවන්න." ගුරුවරිය එහෙම කියන්න වුණා.සියල්ලෝම ගුරුතුමියගේ කතාවට අත්පොළසන් දුන්නා.

නිමි.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට
ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත්
අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත්
සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත්
අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම
සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ
නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව
2014 වසරේ පටන් මාගේ සංකල්පයකට
අනුව ක්‍රියාත්මක පාසල් දරුවන්
ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-670-5